2020 මාර්තු 1 දින ඉරිදා ලංකාදීපයේ 14 වැනි පිටුවේ පළ වී තිබූ මද්‍රසා පැසල් මගින් පතුරුවන ආගමික අන්තවාදය ලිපියට කරන එකතුකිරීමකි.

## ඉස්ලාමය සහ අන්තවාදය දෙකක් නොවේ.

අන්තවාදී අදහස් දරන ඉස්ලාමීය දේශකයන් විශාල පිරිසක් ආගමන විගමන රීති උල්ලංඝනය කරමින් මෙරට රැඳී සිටින බව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සැකසූ විශේෂ වාර්තාව මගින් සොයාගත් බව පසුගිය සතියේ (2020 මාර්තු 1) ඉරිදා ලංකාදීපයේ පළ වූ මද්‍රසා පාසල් මගින් පතුරුවන ආගමික අන්තවාදය නම් ලිපියේ සඳහන් වී තිබුණි. එහි තවදුරටත් සඳහන් කර තිබුණේ සාකීර් වැනි අන්තවාදී ආගමික නායකයන් ලංකාවට පැමිණ දේශන පවත්වා ඇති බව ය.

ඉස්ලාමය ආශ්‍රිත ප්‍රචණ්ඩ මත අන්තවාදය ලෙසත් එවැනි මත දරන/ප්‍රචාරය කරන අය අන්තවාදීන් ලෙසත් හඳුන්වන විට ඉන් හැඟවෙන අරුත වන්නේ මෙය සාමාන්‍ය හෝ මුල් මතය නොවන බවත් විකෘති කරන ලද්දක් පමණක් බවත් ය. එය අන්තයක් මිස සාමාන්‍ය පොදුවේ පිළිගත් අදහස නොවේ. යන්න මීන දෙන අදහසයි. වෙනත් ලෙසකින් කියනවා ආගමේ මූල් දර්ශනය සහ මූලාශ්‍ර සමග එයට ඇති පලහිලව්වක් නැත. එය පසුකාලීන ව ඇතිකරනු ලැබූවක් හෝ පුද්ගලයන් විසින් සංවර්ධනය කරගනු ලැබූ අන්තයක් පමණි. නමුත් මේ අදහස ද නිවැරදි නොවන බව ඉස්ලාමීය මූලාශ්‍ර ඇසුරු කරන විට පෙනී යයි.

### ඉස්ලාමයේ නිර්මාතෘවරයාගේ ක්‍රියාකලාපය

කුරානයෙන් පසු තිබෙන ප්‍රමුඛ ම ඉස්ලාමීය මූලාශ්‍රය වන්නේ සුන්නා හා හදීස් යනුවෙන් හැඳින්වෙන මුහම්මද් නබි (සල්) තුමාගේ කෙරුම් හා කියුම් ය. මේවා වාර්තා කර ඇත්තේ ඒවා ඇසූ දුටු භක්තිවන්ත මුල්කාලීන මුස්ලිම්වරුන් විසින් ය. පහත දැක්වෙන්නේ සුන්නි මුස්ලිම්වරුන් පිළිගන්නා එවැනි ප්‍රමුඛ හදීත් එකතුවක් වන බුහාරි සංග්‍රහයේ එන නබිවදනකි.  මෙය නිවැරදි හෙවත් සහීහ් හදීත් පමණක් අඩංගු වන සංග්‍රහයක් ලෙස ඔවුහු පිළිගනිති.

"අල්ලාහ්ගේ දූතයා මෙසේ පැවසුවේ ය. අල්ලාහ් හැර වෙනත් කිසිම දෙවියකු නැති බවත් මුහම්මද් යනු ඔහුගේ දූතයා බවත් පවසා සලාතය ඉටුකර සදකා බද්ද ගෙවන තුරු මිනිසුන්ට එරෙහිව සටන් කිරීමට මට අල්ලාහ්ගෙන් අණ ලැබී ඇත්තේ ය. ඔවුන් මෙය ඉටුකළහොත් ඔවුන්ගේ ජීවිත සහ ධනය මාගෙන් බේරාගැනීමට හැකිවනු ඇත. එවිට මා ඔවුන්ගේ ජීවිත හෝ ධනය නැතිකරනු ලබන්නේ යුක්තිය පසිඳලීමක දී පමණක් වන අතර ඔවුන් ගැන අල්ලාහ් විසින් වගබලාගනු ඇත.” [1]

(සහීහ් අල්-බුහාරි - බුක් ඔෆ් බිලීෆ්, හදීත් අංක 24, ඉංග්‍රීසි පරිවර්තන මාලාව - වෙළුම 1, පොත 2, හදීත් අංක 25)

මෙයින් පැවසනේනේ කුමක් ද? මිනිසුන් ඉස්ලාමය වැළඳගන්නා තුරු සටන් කරන බව නබිතුමන් පවසා තිබේ. මෙය පෑනෙන් හෝ පොතෙන් කරන අරගලයක් නොවන බව ජීවිත හෝ ආරක්ෂා කරගත හැක්කේ එසේ කිරීමෙන් බව පැවසීමෙන් පැහැදිලි වේ.

ඉතින් කිසියම් ආගමික දේශකයකු මේ අදහස  පැවසුවහොත් ඔහු පමණක් අන්තවාදයකු ලෙස නම්කර විවේචනය කිරීමෙන් හෝ ඔහුට පමණක් නීති ක්‍රියාමාර්ග ගැනීමේ ඇති ඵලදායකත්වය කුමක් ද? තමා පැවසුවේ සිය ආගමික නායකයාගේ ප්‍රකාශයක් බවත්, සිය ආගම සහ ආගමික නායකයා ලෝකයා විසින් ධර්මයක් ලෙස පිළිගන්නේ නම්, ශ්‍රේෂ්ඨ පුද්ගලයකු ලෙස පාසල් දරුවන්ට පවා කියාදෙනු ලබන්නේ නම් ලෝකය විසින් ම ශ්‍රේෂ්ඨ පුද්ගලයකු ලෙස පිළිගත් අයකුගේ අදහසක් ගෙනහැර දැක්වීම ගැන එම ලෝකයා ම අහිංසක තමා පමණක් වරදකරු කරන්නේ මන්දැ යි හෙතෙම විමසනු ඇත. මෙය මගේ අදහසක් නොවේ. ඔබ ම ගරුකරන, ආගමික නායකයකු ලෙස පිළිගන්නට ඉඩ දී තිබෙන අයකුගේ අදහසකි. ඔහු කියනු ඇත.

පහත දැක්වෙන්නෙ තවත් මෙවැනි හදීසයකි.

1 https://sunnah.com/bukhari/2/18

අබ්දුල්ලාහ් විසින් පවසන ලදී. සටන් කර එය ජයග්‍රහණය කළ දවසේ දී නබිතුමන් මක්කාවට ඇතුලු වනවිට කාබාව තුළ පිළිම 360 ක් විය. නබිතුමන් සිය අතේ තිබුණු පොල්ලකින් ඒවාට පහරදෙමින් මෙසේ පවසන ලදී. “සත්‍යය පැමිණ තිබෙන අතර මිත්‍යාව යළි හිස එසවීම හෝ මතුවීම කිසිදා නොසිදුවනු ඇත.”

- සහීහ් අල්-බුහාරි 4287

ඔවුන් විසින් සිදුකළ ක්‍රියාවට පදනම සැපයූ පුද්ගලයා විවේචනය නොකරමින්  මාවනැල්ලේ බුදුපිළිම කැඩූ තරුණයන්ට පමණක් දොස් කිව හැකි ද? ඔවුන් කටයුතු කර ඇත්තේ සිය දහමට අනුව ය. එය අන්තවාදය නොව සැබෑ දහමයි. පහර දිය යුත්තේ ඵලයට නොව හේතුවට ය.

මදීනාවට ගොස් කෙටිකළකින් ම එතුමන් සියවසරක වැඩි මහලු පුද්ගලයෙක් ව තමා ව විවේචනය කරමින් කවියක් ලිවීමේ වරදට ඝාතනය කිරීමට අණ දුන්නේ ය. ඉබ්න් සාද් මේ සිද්ධිය මෙසේ වාර්තාකර තිබේ.

"ඊළගට සිදුවුණේ සලීම් ඉබ්න් උමයිර් අල් අම්රි විසින් යුදෙව් ජාතික අබූ අෆාක්ට එදිරිව කළ වැටලීම (සරිය්යාහ්) යි. හිජ්රාවේ සිට විසිවැනි මාසය ආරම්භයේ එය සිදු විය. බානු අම්ර් ඉබ්න් අව්ෆ් ගෝත්‍රයට අයත් අබූ අෆාක් එකසිය විසි වයසට එළැඹි මහලු පුද්ගලයකු විය. ඔහු යුදෙව්වෙක් වූ අතර අල්ලාහ්ගේ දූතයාට එරෙහි ව මිනිසුන් තුළ මතය ඇතිකිරීමට කටයුතු කරමින් සිටියේ ය. ඔහු මුහම්මද් ගැන උපහාසාත්මක කවියක් රචනා කළේ ය.“මම අබූ අෆාක් ව මරාදමන බවට හෝ නැතිනම් ඔහුගෙන් මැරුම් කන බවට ප්‍රතිඥාවක් දුනිමි” යැයි බද්ර් යුද්ධයට ද සහභාගී වූ අයෙක් වූ සලීම් ඉබ්න් උමයිර් පැවසී ය. අවස්ථාවක් එන තුරු බලා සිටි ඔහු උණුසුම් දිනයක් තෝරා ගත්තේ ය. එදින අබූ අෆාක් එළිමහන් තැනක නිදාගත්තේ ය. මෙය මෙසේ වන බව දැනසිටි සලීම් ඉබ්න් උමයිර් සිය කඩුව අෆාක්ගේ අක්මාව සිදුරු කරමින් ඇද තෙක් කිදා බැස්සුවේ ය. අල්ලාහ්ගේ සතුරා විලාප දුන් අතර ඔහුගේ සගයෝ වහා පැමිණ ඔහු ව ගෙන ගොස් භූමදාන කළෝ ය.” - The Kitab al Tabaqat al kabir, Vol. 2, p 31

"මේ ගැන අසන කුඩා දරුවන් පස්දෙනෙකුගේ මවක් වන අස්මා බින්ත් මර්වාන් නැමති යුදෙව් කත පිටස්තරයකුට පැමිණ තමන් අතර භේද ඇති කර ගෞරවණීය මහලු මිනිසෙකු මරාදමන පහත් තැනට ඔවුන් ව පත්කරන්නට ඉඩදීම ගැන මදීනා වැසියන් ව හෙලාදකිමින් පද්‍යයක් බන්ධනය කළේ ය. මේ අවස්ථාවේ දී ද සිය ගෝලයන් වෙත යන මුහම්මද් "මර්වාන්ගේ දූවගෙන් මා ගලවා ගැනීමට ඉදිරිපත් වන්නේ ඔබෙන් කවුද?” යි අසමින් මොර දෙයි. ඒ අසන උමයිර් බින් අදියි අල් ඛත්මි එදින රැයේ ම ඇගේ නිවසට ගොස් ඇය ව මරාදමයි. පසුදින උදයේ රසූල්වරයා ව හමුවන ඔහු කළ දෙය ගැන දැනුම් දෙයි. එවිට මුහම්මද් මෙසේ පවසයි. “අල්ලාහ්ටත් ඔහුගේ රසූල්වරයාටත් ඔබ කළේ උපකාරයක් උමයිර්.” තමාට මෙහි ඵලවිපාකයක් (විනිශ්චයේ දී) විඳින්නට වේ දැයි ඇසූ විට මුහම්මද් නබි (සල්) තුමා මෙසේ පිළිතුරු දෙයි.  "එළුවන් දෙනේනෙක්වත් ඈ ගැන හිස සලන්නේ නෑ.”” - From pp. 675-676 of The Life of Muhammad , which is A. Guilaume’s translation of Sirat Rasul Allâh by Ibn Ishaq

මෙලෙස අස්මා බින්ත් මර්වාන්ගේ ඝාතනය ගැන මුහම්මද් නබි (සල්) තුමාගේ පැසසුම් ලැබූ පසු ඝාතකයා ඇගේ කුඩා දරුවන් වෙත ගොස් ඝාතනය ගැන පුරසාරම් දොඩමින් ඔවුන් සහ ගෝත්‍රය බියගන්වයි.

ඉබ්න් සාද්ගේ වචනවලින්;

"මර්වාන්ගේ දියණිය සම්බන්ධ සිද්ධිය අරභයා එදින බානු ඛත්මාවරු අතර කළබළකාරී තත්ත්වයක් ඇති වී තිබිණි. ඇයට දරුවන් පස්දෙනෙක් සිටි අතර නබිතුමා වෙත සිට කෙළින් ම ඔවුන් කරා ගිය උමයිර් මෙසේ කී ය. “ඛත්මාවරුගේ දරුවනි, මම බින්ත් මර්වාන් ව මරා දැම්මෙමි. ඔබට හැකි කමක් තිබේ නම් මට එරෙහි වනු. මට රැඳී ඉන්නට නම් සලස්වන්න එපා.” ඉස්ලාමය බලවත් බව බී. ඛත්මාවරුන්ට පළමුවරට පෙනී ගියේ එදින යි. ඊට පෙර සිටි මුස්ලිම්වරු ඒ බව වසන් කළහ. ඔවුන්ගෙන් ඉස්ලාමය වැළඳගත් මුල් ම අය වූයේ උමයිර් බී. අදියි, අබ්දුල්ලාහ් බී. අවුස් සහ කුසයිමා බී. තාබිත් යන අයයි. බින්ත් මර්වාන් මරාදැමූ දින බී. ඛත්මාවරු මුස්ලිම්වරු බවට පත්වූහ. මන්දයත් ඔවුහු ඉස්ලාමයේ බලය කෙතරම් දැයි දුටුවෝ ය.” - From pp. 675-676 of The Life of Muhammad , which is A. Guilaume’s translation of Sirat Rasul Allâh.

චිත්‍රපට අධ්‍යක්ෂක තියෝ වැන් ගෝව් මරාදැමුවේ නෙදර්ලන්තයේ ම සිටි මුස්ලිම්වරයෙකි. ඒ සබ්මිෂන් කෙටි චිත්‍රපටය අධ්‍යක්ෂණය කිරීමේ වරදට ය. ලේඛක සල්මන් රුෂ්ඩිට, ක්‍රියාකාරිනී අයාන් හිර්සි අලි ට මරණ තර්ජන එල්ල වී තිබේ. සැටනික් වර්සස් කෘතියේ ජපන් භාෂා පරිවර්තකයා, හිතොෂි තගරිෂි ද ඝාතනය කෙරුණි. මේවා සිදුකළ අය කටයුතු කළේ සිය ආගමික නායකයා සපයා ඇති ආදර්ශය අනුව ය. ආදර්ශය ආදර්ශයක් ලෙස පිළිගැනෙන තුරු ආදර්ශයට ගැනීම සිදුවෙනු ඇත.

ඉස්ලාමය හැර යන්නන් ඝාතනය කිරීම (සුනන් අබූදාවුද් 4351, තිර්මිදි 1402, බුහාරි 5057) , බිරිඳට පහර දීම (කුරානය 4: 34), අනාචාරය කරන්නන් ගල්ගසා මැරීම (සුනන් අබූදාවුද් 38: 4421, 38: 4429), සමලිංගිකයන් ඝාතනය කිරීම (සුනන් අබූදාවුද් 40: 112), යුද්ධයෙන් අල්ලාගන්නා කාන්තාවන් දූෂණය කිරීම (කුරානය 4: 24, සුනන් අබූදාවුද් 2150) වැනි අන්තවාදීන්/ත්‍රස්තවාදීන් සිදුකරන ඕනෑ ම ක්‍රියාවක් මෙබඳු ය. ඒ සෑම ක්‍රියාවක් ම ඉස්ලාමයේ දෙවියන්ගේ හෝ ඔහුගේ දූතයාගේ ආශිර්වාදය ලබා තිබේ.

**ආගමක වෙස්ගත් දේශපාලන වැඩපිළිවෙළක්**

ඉස්ලාමය යනු පරිපූර්ණ ජීවන දර්ශනයක් බව මුස්ලිම්වරු පවසති. මෙහි අරුත ඉස්ලාමය යනු අන් ආගම් මෙන් ආධ්‍යාත්මික ජීවිතය උදෙසා අනුශාසනාවක් නොව සෑම ලෞකික අංශයක් ම නියාමනය කරන නීති සංග්‍රහයක් බවයි. කුරානයේ අපරාධ, දඬුවම් ආදී නීතිමය කරුණු සම්බන්ධයෙන් දක්වා ඇත්තේ තෝරා බේරා ගෙන, කපා කොටාගෙන, ඇවැසි නම් පමණක් පිළිපැදිය හැකි උපදෙස් නොව අත්හළ නොහැකි අණ ය. කුරානයේ 5: 49, 5: 50, 4: 44 වැකි දෙස බලන විට මුස්ලිම්වරුන්ට මේ බව පැහැදිලි වේ. ඔවුන්ට එහි කොටසක් පමණක් තෝරාගත නොහැකිය. මේ නිසා සිය ආගම නිවැරදිව පිළිපැදීමට නම් තමන් ජීවත් වන රටවල ෂරියාව මුලුමනින් ම ස්ථාපිත කරවා ගැනීම මුස්ලිම්වරුන්ගේ අපේක්ෂාව වේ. එය ඔවුන්ගේ ආගමික යුතුකමක තැනට පත් වේ. යහපත්, අහිංසක පුද්ගලයාගේ පටන් සෑම භක්තිමත් මුස්ලිම්වරයෙක් ම දේශපාලන ව්‍යාපෘතියක කොටස්කරුවකු වන්නේ මේ අන්දමට ය. ෂරියාව මුලුමනින් ම ක්‍රියාත්මක නොකරන මුස්ලිම් බහුතර රටවල් පවා ප්‍රහාරයට ලක්වන්නේ ඉස්ලාමයේ අවසන් අරමුණ ෂරියාව ලොව පුරා ස්ථාපිත කරවා ගැනීම නිසා ය.

ආගම ඇදහීමෙන් වැළැක්වීම ආගමික හිංසනයක් වන අතර ආගමික හිංසනයක දී මුස්ලිම්වරුන්ට ආගම වෙනුවෙන් සටන් කිරීමට අවි අතට ගත හැකි බව ඉස්ලාමීය වියතුන් මෙන් ම සෑම මුස්ලිම්වරයෙක් ම පිළිගනනා මතයකි. ලෝකයේ බොහෝ රටවල ෂරියා මුලුමනින් ම හෝ ඇතැම් කොටස් පිළිපැදීම තහනම් කර තිබේ. ඉහත කරුණු අනුව මුස්ලිම්වරු සමස්ත ෂරියාව පිළිපැදිය යුතු බැවින් මෙය ඔවුන්ගේ ආගමික හිමිකම් උල්ලංඝනයක් ලෙස පවසමින් තමා ජීවත් වන රටවල රාජ්‍යයන්ට එරෙහි ව සටන් කිරීමට පදනමක් සපයා ගැනීමේ හැකියාව ද ඉස්ලාමය තුළ තිබේ. මෙවැන්නක් වැළැක්විය හැකි ඉස්ලාමීය තර්කයක් නැත.

ප්‍රථම ඉස්ලාමීය රාජ්‍යය විනාශ වී ගිය පසු, අවනසන් විනිශ්චයට පෙර අනාගතයේ නැවත වරක් ඉස්ලාමීය රාජ්‍යය (caliphate) ඇතිවන බව මුහම්මද් නබි (සල්) තුමන් පවසා තිබේ. අල්-සිල්සිලාහ් අස්-සහීලාහ් වෙලුම 1, අංක 5. ඉස්ලාමීය රාජ්‍යයක් යනු ඉස්ලාමීය නීතිය පමණක් ක්‍රියාත්මක කරන, මුස්ලිම්වරුන් විසින් පත්කරන ආගමික ප්‍රධානියකුගේ ආඥාදායකත්වයෙන් පාලනය වන රාජ්‍යයකි. එහි මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය නැත. මිනිසුන් සෑදූ නීති නැත. මුස්ලිම් නොවන්නන්ට ඇතැම් සීමා තිබේ. විනිසුරුවරු හා අධිකරණ මුස්ලිම් ය. මෙවැනි රාජ්‍යයක් විසින් සමස්ත මුස්ලිම් ප්‍රජාව (උම්මා) පාලනය වීම මේ අනුව කෙදිනක හෝ සිදුවිය යුතු ය. ඒ අරමුණු සඳහා, ගෝලීය මුස්ලිම් රාජ්‍යයක් පිහිටුවීම සඳහා යුද්ධ සිදුවීම මේ අනුව නොවැළැක්විය හැකි ය. සහීහ් මුස්ලිම්, පොත 020, හදීත් අංක 4562 අනුව කාලිෆ්වරයකුට අවනත නොවීම පාපයක් හා අපරාධයක් වේ. මුස්ලිම් ප්‍රජාව නායකයන් දෙදෙනෙකුට අවනත නොවිය යුතු බවට මුල්කාලීන ඉස්ලාමීය විශාරදයන් සැවොම එකග වේ. ඉස්ලාමීය රාජ්‍යයක් ප්‍රකාශයට පත් කළ විට එය නොපිළිගන්නා එහි කාලිෆ්වරයාට පක්ෂපාතී නොවන මුස්ලිම්වරු ඉස්ලාමය හැර ගියවුන් හෝ ඉස්ලාමයේ සතුරන් බවට පත් වේ. ආගම හැර ගිය විට ඝාතනය කළ යුතු ය. එමෙන් ම කාලිෆ්වරයකුට ආක්‍රමණික ජිහාඩයක් (offensive jihad) ඇරඹිය හැකි ය. ජිහාඩය සිදුකරන එකම අරමුණ ආත්මාරක්ෂාව නොවේ. අන් දේශයන් ආක්‍රමණය කරන මිනිසුන් විසින් නිපදවූ (ජහීලි) නීති හා අයතන මුලිනුපිටා දමා දිව්‍යමය නීතියට අනුව පාලනය කිරීම සඳහා සටන් කිරීම ආක්‍රමණික ජිහාඩය යි. එය සඳහා අණ කළ හැක්කේ කාලිෆ්වරයකුට පමණි. අද ප්‍රකාශයට පත්කර තිබෙන ඉස්ලාමීය විනාශ කළත් හෙට තවත් පිරිසක් ඒ සඳහා අරගලය අරඹනු ඇත. ඒ නබිතුමාගේ අනාවැකිය සත්‍ය විය යුතු නිසා ය.

අර්ෆජා විසින් වාර්තා කරන සහීහ් මුස්ලිම්හි එන හදීසයකට අනුව "ඔබ තනි පුද්ගලයකුගේ නායකත්වය යටතේ ඒකරාශී වන්නට යන විට ඔබේ ශක්තිමත්බව සහ එකුමුතුබව බිඳ දැමීමට සහ ඔබ ව බෙදීමට යමෙකු පැමිණෙන්නේ නම් ඔහු ව මරාදමන්නැ" යි නබිතුමා පවසා තිබේ.

Open Letter to Bagdadi (http://www.lettertobaghdadi.com/) මැයෙන් ඉස්ලාමීය රාජ්‍යයේ හිටපු කලීෆා බග්දාදිතුමන් වෙත එතුමන්ගේ ක්‍රියාකලාපයන් විවේචනය කිරීමට ඉස්ලාමීය මූලාශ්‍ර ඇසුරින් ප්‍රබල ලෙස තර්ක දක්වමින් ලිපියක් යවන ලද්දේ ලොව පුරා ඉස්ලාමීය වියතුන් 127 ක් විසිනි. එහි ඔවුන් ඔවුන්ගේ සෙසු ක්‍රියාකලාපය විවේචනය කළත් ඉස්ලාමීය රාජ්‍යා යළි පිහිටුවීම වැරදි බව නොකියයි. ඒ සඳහා ප්‍රබල තර්කයක් ඉදිරිපත් කිරීමට අසමත් වේ. ඔවුන් විවේචනය කිරීමට සමත් වන්නේ එම ඉස්ලාමීය රාජ්‍යයේ කාලිෆ්වරයා තෝරාගත්තේ ලොව පුරා මුස්ලිම්වරුන් විසින් නොවන බව පවසමින් පමණි. ඔවුන්ට දැක්විය හැකි වෙනත් ප්‍රබල තර්කයක්, ඉස්ලාමීය මූලාශ්‍රයක් පැවතියේ නම් ඔවුන් ඉතා සතුටින් එය සිය විවේචනය ඇතුළත් කරනු නිසැක ය. එසේ නොකළේ එවැන්නක් නොතිබූ නිසා ය. වෙන ලෙසකින් කියනවා නම් ඉස්ලාමීය රාජ්‍යයක් ප්‍රකාශයට පත්කිරීම, එය නොපිළිගන්නා මුස්ලිම්වරු ඝාතනය කිරීම, එය පුලුල් කරගැනීම සඳහා යුද්ධ කිරීම ඉස්ලාමය පවතින තුරු සිදුවනු ඇත.

"නබිතුමා මෙසේ කී බව අබූ හුරයිරා පැවසී ය. මුස්ලිම්වරුන් යුදෙව්වන් සමග සටන් කරන තුරු සහ යුදෙව්වන් ගස් ගල් පිටුපස සැගවෙන තුරු සහ මුස්ලිම්වරුන් ඔවුන් මරන තෙක් අවසන් (විනිශ්චයේ) පැය උදා නොවන්නේ ය. යුදෙව්වන් එසේ ගස් ගල් පිටුපස සැගවෙන කල්හි එම ගස් සහ ගල් මෙසේ කියනු ඇත්තේ ය. මුස්ලිම්වරය, අල්ලාහ්ගේ ගැත්ත, මේ මාගේ පිටුපසත් යුදෙව්වෙක් සිටී. පැමිණ ඔහු මරා දමාපන්න. නමුත් එක ම එක ගසක් එසේ නොපවසනු ඇත්තේ ය. ඒ යුදෙව්වන්ගේ ගසක් වන සර්කාද් ගසයි." - සහීහ් මුස්ලිම් 2922

අයි. එස්. සංවිධානය ඊශ්‍රායලය සහ යුදෙව්වන් සම්බන්ධව දක්වන ප්‍රකාශ මේ ආකල්පය පිළිබිඹු නොකරන්නේ ද? ඔවුන් පවසන පරිදි හිටපු (මියගිය) කාලිෆ්වරයාගෙන් පසු පත්වන්නේ තවත් 12 දෙනෙක් පමණි. අනුතුරුව අවසන් විනිශ්චය සිදු වේ. එය උදාවන්නේ මුස්ලිම්වරු යුදෙව්වන් මැරූ පසු ය. මුහම්මද් අනාගත සංහාරයන්ට ද පදනම දමා ඇත්තේ එ පරිද්දෙනි.

**අභ්‍යන්තර සතුරාට මුහුණදීම**

අපි අන්තර්ජාලයෙන්, විදේශිකයන්ගෙන් පැමිණෙන අන්තවාදී (සත්‍ය ඉස්ලාම්) මතවලට වැට බඳින හැටි ගැන කතාකරමු. නමුත් පිටින් පැමිණි මූලධර්මවාදී ව හෝ අන්තවාදීව කටයුතු කරන හැටි ගැන තමන්ට අලුතින් කියාදෙන්නට අවශ්‍ය නොවන අපේ මුස්ලිම් සහෝදරවරු පෙන්වා දී තිබේ. මා මේ කතාකරන්නේ පාස්කු ප්‍රහාරය හෝ ත්‍රස්තවාදී කණ්ඩායම් ගැන නොවේ. හිෂානා හමීන් සහ හසනා සේගු ඉසදීන් මුස්ලිම් විවාහ නීතියේ ගැටලු අළලා කළ ක්ෂේත්‍ර අධ්‍යයනයක් Unequal Citizens මැයෙන් mplreforms.com අඩවියේ භාෂා ත්‍රයෙන් ම පළ කර තිබේ. කාතිවරුන් සමග සාක්ච්ඡා කිරීමේ දී දැනගත් දෙයක් ඔවුහු එහි සඳහන් කරති. ඒ නැගෙනහිර පළාතේ හිටපු කාතිවරයා අනාචාරය වරදට කසපහර දඬුවම් ක්‍රියාත්මක කළ බව ඔහු සම්මුඛ සාකච්ඡාවල දී ඔවුන් සමග පැවසූ බවයි. සැමියා හෝ බිරිඳ අනෙක් පාර්ශවයේ එවැනි සම්බන්ධයක් ගැන දැනුම් දුන් විට ඔහු එම අනාචාරයේ හැසිරුණු දෙදෙනාට ම විවාහක නම් කසපහර 110 ක් ද අවිවාහක නම් 100 ක් ද ලබා දී ඇත්තේ මුස්ලිම් දේවස්ථාන කමිටුවේ සාමාජිකයන් වන පිරිමි සාක්ෂිකරුවන් 4 දෙනකු ඉදිරිපිට දී ය. කාතිවරයාට දඬුවම් දීමේ බලයක් නැති බවත්, මුස්ලිම් විවාහ නීතිය තුළ එවැනි ප්‍රතිපාදන නැති බවත් පවසන කර්තෘවරියෝ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය අනුව මෙය රජයේ නිළධාරියකු විසින් සිදුකළ වධහිංසාවක් නිසා මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක බව පවසති. ඒ අනුව මෙයට පියවර ගත හැකි ය. නමුත් රජයේ නිලධරයකු නොවන අයකු මෙවැන්නක් සිදු කළේ නම් සහ එයට ගොදුරු වූ පාර්ශ්ව විසින් පැමිණිළි නොකළේ නම් ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග මොනවා ද යන්න අවිනිශ්චිත ය. ඇතැම් විට මුස්ලිම් දෙවස්ථාන කමිටු අතවරයන්ට ලක්වූ දැරියන්ට නරක නමක් ඇතැයි කියමින් අතවරකරුවනට ම බලෙන් විවාහ කරවා දී පාසල් අධ්‍යාපනය පවා නැතිකර තිබෙන අවස්ථා එම අධ්‍යයනයේ තිබේ.

ප්‍රජා මට්ටමින් මුස්ලිම් දේවස්ථාන කමිටු විසින් දඬුවම් පැමිණවීම සිදුවන බව සඳහන් කරන කර්තෘවරියෝ මෙසේ පවසති.

"ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා වලින් හෙළි වූයේ, අනාචාරය ගැන සැකකරන පුද්ගලයින් හට කසපහර දඬුවම් දීම ප්‍රජාව මට්ටමේ සිදුවන අතර, එය මුස්ලිම් දෙවස්ථාන කමිටුව සහ මුස්ලිම් දේවස්ථාන සම්මේලන

මගින් බලය දීමෙන් සිදුවිය හැක. .... එම ප්‍රදේශවල කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන ප්‍රකාශ කළේ, මෙම භාවිතය සම්මතයක් සහ ෂරියා හි කොටසක් ලෙස නීතිමය සහ නීත්‍යානුකූල දඬුවමක් ලෙස ප්‍රජාව දකින බව ය. එමනිසා එයට මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ අවසර දී ඇති බව සලකමින් එය ප්‍රශ්න කර හෝ අභියෝගයට ලක්කර නැත."

මෙවැනි ක්‍රියා බෞද්ධයන් වෙතින් හෝ භික්ෂූන්ගේ මැදිහත්වීමෙන් සිදුවිණි නම් එන්. ජී. ඕ. භක්තිකයන් රට දෙවනත් කරන උජාරුව බලාගන්නට තිබුණි. මෙලෙස මුස්ලිම් දේවස්ථාන මගින් දඬුවම් දීම අනාචාරය සම්බන්ධයෙන් පමණක් නොව ඉස්ලාමය හැර යාම හෝ අන්‍යාගමිකයන් සමග විවාහ වීම, පෙම් සබඳතා පැවැත්වීම ආදිය සම්බන්ධයෙන් ද සිදුවන බව පසුගිය සමයක මාධ්‍ය වාර්තා මගින් හෙළි විය. (මුස්ලිම් දේවස්ථාන විසින් සිදුකර ඇති මෙවැනි ක්‍රියා සම්බන්ධව ජමියතුල් උලමා සංවිධානයට ද නොමිදිය හැකි වගකීමක් පැවරේ. ඔවුන් දන්නේ සිංහලයන්ට බණ කීමට පමණි.) මෙවැනි ක්‍රියාකාරකම් රටේ සහජීවනය, ආරක්ෂාව, සාමය, ජාතික ඒකාග්‍රතාවයට හානිකර බැවින් මේවා කැරළිකාරී, ස්වභාවයේ ක්‍රියාකාරකම් ලෙස හඳුනාගැනීමට නීති සම්මත විය යුතු ය.

Understanding Muslims and Muhammad පොතේ හිටපු මුස්ලිම්වරයකු වන ආචාර්ය අලි සිනා මෙසේ පවසයි.

"ඉස්ලාමය ආගමක වෙස්ගෙන සිටින අතර සිය ප්‍රකාශනය සඳහා ආගමික භාෂාවක් ද යොදාගනී. එහෙත් එහි අවසන් අරමුණ ගෝලීය ආධිපත්‍යය යි. නාසිවාදය සහ කොමියුනිස්ට්වාදය විසින් ද මුදුන්පත් කරගැනීමට අපේක්ෂා කළේ මෙය යි. ඉස්ලාමයට ඇත්තේ ලෞකික සහ දේශපාලනික වැඩපිළිවෙළකි. එහි ඇතැයි කියන ආගමික පණිවිඩය චූකලී කේක්ගෙඩියක මතුපිට තිබෙන අයිසිං එකක් වැන්නක් පමණි. ඉස්ලාමයේ අවසන් අරමුණ දේශපාලනික එකක් බැවින් එය දේශපාලන මතවාදයක් ලෙස දැකිය යුතු ය. අපට ඉස්ලාමයේ දේශපාලනික අංශය තහනම් කළ හැකි අතර එය එහි අවසානය වනු ඇත. ලෝකය යටත් කරගැනීම සඳහා වූ සිය දේශපාලන ව්‍යාපෘතිය නොමැති ව ඉස්ලාමයට පැවතීමට හේතුවක් නැත.

අපට ඉස්ලාමය ආගමක් ලෙසින් තහනම් කළ නොහැකි වුවත් එය දේශපාලන ව්‍යාපාරයක් ලෙසින් තහනම් කළ හැකි ය. නීති පද්ධතියක් ලෙස ඉස්ලාමය අපේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රම සහ පිළිගත් මානව අයිතීන් සමග ගැටේ. නිදසුන් ලෙස සියලු මිනිසුන් නීතිය ඉදිරියේ සමාන බව එය නොපිළිගනී. එය කාන්තා පිරිමි දේපාර්ශවයට සම අයිතිවාසිකම් ලබා නොදේ. එය ආගම අතහැරයාමට මුස්ලිම්වරුන්ට ඇති අයිතිය නොපිළිගනී. මේ කරුණු අනුව ඉස්ලාමය අපේ වටිනාකම් සහ නීති උල්ලංඝනය කිරීමට අදහස් කරන දේශපාලන ව්‍යාපෘතියක් බැවින් එහි එම අංශය තහනම් කළ හැකි ය.

සියලුම මුස්ලිම් සංවිධාන, පල්ලි සහ පූජකවරු ෂරියාව ප්‍රචාරය හෝ දේශනා නොකරන බවට වූ එකගතාවකට අත්සන් තැබිය යුතු ය. ප්‍රතික්ෂේප කරන්නන් රටින් පිටමං කිරීමට සහ ඔවුන්ගේ සංවිධාන වසා දැමීමටත් හැකිවන පරිදි නීති සම්පාදනය කළ යුතු ය."

මුහම්මද් පිළිබඳ මනෝවිද්‍යාත්මක කියවීමක් වන අලි සිනාගේ එම කෘතිය මේ ගැන උනන්දුවක් දක්වන සෑම අයෙක් ම, විශේෂයෙන් ම සෑම මුස්ලිම්වරයෙක් ම කියවිය යුතු ය. එහි දෙමළ පරිවර්තනයක් ද faithfreedom අඩවියෙන් නොමිලේ බාගත හැකි ය.

පහත ආකාරයේ නීති සම්මතයක් ඇතැම් විට ප්‍රයෝජනවත් විය හැකි ය.

1. ආගමික නීතියක් ක්‍රියාත්මක කිරීමක් යැයි හැගෙන ආකාරයේ කිසියම් හෝ ක්‍රියාකාරකමක්, ශාරීරික වධහිංසාවක්, බලකිරීමක් සිදුකිරීම, සහය දීම, අනුබල දීම කැරළිකාරීත්වයක් ලෙස සැලකීමට සහ සුදුසු දඬුවම් ලබාදිය හැකි නීතියක් සම්මත විය යුතු ය.

2. ශ්‍රී ලංකාව තුළ හෝ පිටත ශ්‍රී ලංකාව හෝ වෙන යම් රාජ්‍යයක් ආගමික රාජ්‍යයක් බවට පත්කිරීමට සැලසුම් කිරීම, ජනමතය සකස් කිරීම, කටයුතු කිරීම සහ ඊට ආධාර කිරීම, කවර හෝ ආකාරයකින් අනුබල දීම කැරළිකාරිත්වයක් ලෙසින් සැලකිය යුතු අතර සුදුසු මට්ටමේ දඬුවම් පැමිණවිය යුතු ය.

මෙහි ආගමික රාජ්‍යයක් යනු පහත ලක්ෂණ සියල්ලම හෝ කීපයක් සපුරන පාලන ක්‍රමවේදයක්, අධිකරණ පද්ධතියක් හෝ එවැනි බල ඇති වෙන යම් ව්‍යුහයක් හෝ නීතියක් විය හැකි ය.

- මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය නොපැවතීම වැනි ආඥාදායකයක ලක්ෂණ තිබීම

- විශ්වීය ව පිළිගත් මානව අයිතිවාසිකම් (කැමති ආගමක් වැළඳගැනීමට ඇති අයිතිය, කැමති ආගමික චාරිත්‍රයක් පිළිපැදීමේ අයිතිය) අභිමි වන ආකාරයේ නීති පැවතීම
- කිසියම් ආගමික ව්‍යුහයක් විසින් අධිකරණ හෝ විධායක හෝ අනෙකුත් පාලන බලතල ක්‍රියාත්මක කිරීම
- හුදෙක් ආගමික මත අනුව පමණක් වැරදි වන ක්‍රියා සඳහා අපරාධ වැරදි සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයෙන් කටයුතු කෙරෙන නීති පැවතීම

ඒ සඳහා ආධාර කරන, අනුබලයක් වන සංවිධාන, මතවාද, දර්ශන, අර්ථනිරූපණ, පොතපත, වෙබ් අඩවි ඇතුලු අන්තර්ජාල මූලාශ්‍ර තහනම් විය යුතු ය. එවැනි තහනම් යැයි නම් කළ මූලාශ්‍රයක් ශාස්ත්‍රීය කටයුත්තක් සඳහා හැර සන්තකයේ තබාගැනීම, සමාජයට මුදාහැරීම, ප්‍රතිනිර්මාණය කිරීම සිදුකරන අය ද මෙ වරද සඳහා වරදකරුවන් ලෙස සැලකිය යුතු ය. මෙවැනි කටයුතුවල නියුතු ආගමික ස්ථාන වෙතොත් එම ස්ථාන වසා දමා, පූජකවරුන් රටින් නෙරපිය යුතු ය.

- සචින්ත මදූෂාන්
ගාල්ල